26-01-2026 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ චක්‍රයෙන් භාගයක්ම වන්දනා කළ පියා, ඒකායන කෙනා, ඔහුම දැන් ඔබට උගන්වමින් සිටිනවා. ඔබ දේවතාවන් වන්නේ මෙම ඉගෙනුම තුළින්ය.

**ප්‍රශ්නය:** යෝගා බලය නම් සෝපානයේ ඇති විශ්මය කුමක්ද?

**පිළිතුර:** ඔය දරුවන් තත්පරයකදී යෝගා බලයේ සෝපානයෙන් ඉහළට නඟී, එනම්, ඔබට ජීවන-මුක්තියේ උරුමය, තත්පරයකදී ලැබෙයි. ඉනිමඟ දිගේ පහළට පැමිණීමට වසර 5000 ක් ගත වන බවත්, ඔබ තත්පරයකදී ඉහළ නඟින බවත් ඔබ දන්නවා. යෝගා බලයේ විශ්මය මෙයයි. පරම පියාගේ සිහිපත් කිරීම තුළින්, ජීවාත්මයේ සියලුම පාපයන් කැපී ගොස්, ඔබ සතෝප්‍රධාන් වනවා.

ඕම් ශාන්ති. ආධ්‍යාත්මික පියා අසුන් ගෙන, ආධ්‍යාත්මික දරුවන්ට විස්තර කරයි. ආධ්‍යාත්මික පියාගේ ප්‍රශංසාව දරුවන්ට කියා තිබේ. ඔහු ඥානයේ මහා සාගරයයි, සත්‍යයයි, ජීවමාන ජීවාත්මය සහ ආනන්දයෙන් පිරි කෙනායි සාමයේ මහා සාගරය ඔහුයි. සියලුම අසීමිත වර්ණනාව ඔහුට ලබා දෙයි. පරම පියා, ඥානයේ මහා සයුරයි. මෙකල සියලුම මනුෂ්‍යයන්, භක්තියේ සාගර බව ඔබ දන්නවා. ශ්‍රේෂ්ඨතම බැතිමතුන් වන අයට ගෞරව ලැබෙයි. මෙකල, කලි යුගයේ, භක්තිය සහ දුක තිබෙන අතර ස්වර්ණමය යුගයේ, ඥානයෙන් ලද සතුට තිබේ. ඔවුන්ට එහිදී ඥානය නොමැත. මෙම වර්ණනාව ඒකායන පියාගේම පමණයි. එය දරුවන්ගේද වර්ණනාවයි, මන්ද, පරමාත්ම පියා දරුවන්ට උගන්වන බැවින්, එනම්, ඔහු ඔවුන්ට මෙම වන්දනා ගමන උගන්වයි. වන්දනා ගමන් දෙවර්ගයක් තිබෙන බව පියා විස්තර කර තිබේ. බැතිමතුන් වන්දනා ගමන් යන අතර ඔවුන් ප්‍රධාන වන්දනා ස්ථාන හතරට යයි. වන්දනා ගමන යන කාලය තුළදී ඔවුන් පාපයේ ගැලෙන්නේ නැත ඔවුන් මත්පැන් පානය නොකරන අතර, අපවිත්‍ර කිසිවක් නොකයි. විටෙක ඔවුන් බද්‍රිනාථ වලටත්, විටෙක කාශී වලටත් යයි. ඔවුන් දෙවියන්ව වන්දනා කරයි. පරමාත්ම දෙවියන් එක් අයෙක් පමණයි. ඔවුන් (ඔහු සොයමින්) සෑම තැනකටම නොයා යුතුයි. ඔවුන් ශිව බාබා වෙතට වන්දනා ගමන් යයි. සිහි කර ඇති ශ්‍රේෂ්ඨතම වන්දනා ගමන වන්නේ, ශිවාගේ ස්ථානය ලෙස හැඳින්වෙන, බරණැසයි. ඔවුන් සෑම දිශාවකටම යන නමුත්, දර්ශනයක් ලබා ගැනීමට යන කෙනාගේ හෝ වන්දනා කරන කෙනාගේ චරිත කතාව හෝ කාර්යය ගැන කිසි කෙනෙක් නොදනී. එයට අන්ධ විශ්වාසය යැයි කියන්නේ ඒ නිසාය. කෙනෙක්ව වන්දනා කර, එම කෙනාට හිස නමන නමුත්, ඔහුගේ චරිත කතාව නොදැන සිටීමට, අන්ධ විශ්වාසය යැයි කියයි. ඔවුන් ඒ සියල්ල නිවසේදී සමරා, දේවතාවියන්ව බොහෝ සේ වන්දනා කරයි! ඔවුන් මැටි වලින් දේවතාවියන් සාදා, ඔවුන්ව බොහෝ සේ සරසයි. නිදසුනක් සේ ඔවුන් ලක්ෂ්මිගේ අජීව පිළිමයක් සාදයි. ‘ඇගේ චරිත කතාව කුමක්ද?’ කියා ඔවුන්ගෙන් විමසූ විට, ඇය ස්වර්ණමය යුගයේ අධිරාජ්‍යාවරියක් හෝ රිදී යුගයේ සීතා බව කියයි. කෙසේවෙතත්, ඔවුන් කොපමණ කාලයක් පාලනය කළාද? ලක්ෂ්මි සහ නාරායනගේ රාජධානිය කවදා සිට කවදා දක්වා පැවතුණාද? කිසි කෙනෙක් මෙය නොදනී. භක්ති මාර්ගයේදී මිනිසුන් වන්දනා ගමන් වල යයි. ඒ සියලුම මාවත් දෙවියන්ව මුණගැසීම සඳහාය. ආගමික ග්‍රන්ථ හැදෑරීමත් දෙවියන් මුණ ගැසීමේ මාර්ගයකි. කෙසේවෙතත්, පරමාත්ම දෙවියන් සිටින්නේ කොහේද? ඔවුන් කියන්නේ ඔහු සෑම තැනකම සිටින බවයි. මෙම ඉගෙනුම තුළින් ඔබ දැන් දේවතාවන් වන බව, ඔබට වැටහෙයි. පරම පියාම පැමිණ ඔබට උගන්වයි. එම පියා මුණගැසීමට ඇති භක්ති මාර්ගය, චක්‍රයෙන් භාගයකට පවතී. ඔබ පවසන්නේ බාබා, අපව පාරිශුද්ධත්වයට පත්කර, අපට ඔබගේ හැඳින්වීමද ලබා දෙන්න - ඔබ කවුරුන්ද කියා. ජීවාත්ම වන ඔබලා, තිත් බව බාබා විස්තර කර ඇත. මෙහිදී ශරීරයක් ලැබෙන්නේ ජීවාත්මයටයි. එබැවින් ජීවාත්ම, මෙහිදී ක්‍රියා සිදුකරයි. දේවතාවන් පිළිබඳව කියැවෙන්නේ, ඔවුන් අතීතයේ ස්වර්ණමය යුගයේ පාලනය කළ බවයි. පියා වන දෙවියන්, සැබවින්ම පාරාදීසිය ස්ථාපිත කළ නමුත්, ඔවුන් එවිට එහි නොසිටි බවත්, ක්‍රිස්තියානුවන් විශ්වාස කරයි. පාරාදීසිය පැවතුනේ භාරතයේය. ඔවුන්ගේ බුද්ධි තවමත් හොඳය. භාරතයේ ජනයා සතෝප්‍රධාන් වන අතර, ඔවුන් තමෝප්‍රධාන් ද වෙයි. ක්‍රිස්තියානුවන් එතරම් සතුට හෝ එතරම් දුක දකින්නේ නැත. දැන් අවසානයේ පැමිණ ඇති අයට, බොහෝ සතුට තිබේ! පෙර කල ඔවුන් දුගී විය. වෙහෙස වී වැඩ කිරීමෙන් කෙනෙකුට බොහෝ උපයා ගත හැක. ක්‍රිස්තුස් වහන්සේ පළමුව තනිව පැමිණ, ඔහුගේ ආගම ස්ථාපිත කළ අතර, එය දිගින් දිගටම වර්ධනය විය. එක්කෙනෙක් දෙදෙනෙක් බවටත් ඉන්පසුව හතර දෙනෙක් බවටත්, ඒ අන්දමින් ක්‍රම ක්‍රමයෙන් ව්‍යාප්ත විය. බලන්න ක්‍රිස්තියානුවන්ගේ

වෘක්ෂය කෙතරම් විශාල වී තිබේද කියා. අත්තිවාරම වන්නේ දේවතා වංශයයි. එය දැන් මේ කාලයේදී මෙහි ස්ථාපනය කෙරෙනවා. පළමුව එක් බ්‍රහ්ම පමණක් සිටින අතර, පසුව දරුකමට හදාගන්න දරුවන් සංඛ්‍යාව, බ්‍රහ්මනයින්, වැඩිවෙයි. පරම පියා උගන්වන විට බොහෝ බ්‍රහ්මනයන් නිර්මාණය වනවා. පළමුව සිටියේ මෙම එක් අය පමණයි. එක් අයෙකුගෙන් පමණක් බොහෝ වර්ධනය සිදු වී ඇති අතර, තව බොහෝ සේ ව්‍යාප්තිය සිදුවෙයි. සූර්ය සහ චන්ද්‍ර රාජ පෙළපත්වල දෙවතාවන් කෙතරම් සංඛ්‍යාවක් සිටින්නේද, එපමණ බ්‍රහ්මනයින් සංඛ්‍යාවක් සිටිය යුතුයි. පළමුව සිටින්නේ එක් පරමාත්ම පියා පමණයි. ඔහුගේ ජීවාත්මය සැම කලටම පවතී. පියාට දරුවන්, ජීවාත්ම, කෙතරම් සංඛ්‍යාවක් සිටිනවාද? අප සියලුම ජීවාත්මයන්ගේ පරමාත්ම පියා, එක් සදාතනික පියා වන අතර, ලෝක චක්‍රය දිගින් දිගටම භ්‍රමණය වෙයි. සියලුම මනුෂ්‍යයන්, සැම විටෙකම නොසිටියි. ජීවාත්මයන්, ඔවුන්ගේ විවිධ වූ චරිත කොටස් රඟපෑ යුතුයි. මෙම වෘක්ෂයේ පළමුවෙන්ම පැමිණෙන කඳ, සැදෙන්නේ දේවතාවන් ගෙනි. ඉන්පසුව ඉන් අතු රිකිලි මතුවෙයි. එබැවින් පරම පියා මෙහි අසුන්ගෙන, ඔහු පැමිණි විට, කරන්නේ කුමක්ද කියා, ඔය දරුවන්ට විස්තර කර දෙයි. සැම දෙයක්ම ධාරණය කරගන්නේ ජීවාත්මයයි. ඔහු පැමිණෙන්නේ කෙසේද කියා පරම පියා මෙතැන අසුන්ගෙන විස්තර කරයි. ඔබ අපවිත්‍ර වූ විට ඔය සැම දරුවෙක්ම මා සිහිකරයි. ස්වර්ණමය සහ රිදී යුගවලදී ඔබ සතුටින් සිටියා ඔබ මා සිහි කළේ නැත. තඹ යුගයෙදී දුක වැඩි වීමට පටන් ගත් විට, ඔබ මට කන්නලව් කළා අහෝ බාබා! පරම පියා, පරමාත්ම ජීවයනි! ඔව්, දරුවනි, මට ඔබේ හඬ ඇසුණා. ඔබට අවශ්‍ය මොනවාද? බාබා, පැමිණ අපවිත්‍ර අයව පිවිතුරු කරන්න! බාබා, අපි බොහෝ දුකින් මෙන්ම අපවිත්‍ර වී ඇත! පැමිණ අපව පිවිතුරු කරන්න! අපට අනුකම්පා කරනු මැනවි! මට ආශිර්වාද කරන්න! ඔබ මට කන්නලව් කළා බාබා, පැමිණ අපවිත්‍ර අයව පිවිතුරු කරන්න! ස්වර්ණමය යුගයට පිවිතුරු බව කියයි. පියාම මෙතැන අසුන් ගෙන මෙය පහදා දෙයි. නාටකයේ සැලසුමට අනුව, එය සංගම යුගය වූ කල්හි, ලෝකය පැරණි වූ විට, එවිටයි මා පැමිණෙන්නේ. සන්‍යාසීන් දෙකොටසක් සිටින බව ඔබට වැටහෙයි. ඔවුන් හත යෝගීන්ය. ඔවුන්ට රාජයෝගීන් යැයි කිව නොහැක. ඔවුන්ගේ අත්හැරීම සීමිතයි. ඔවුන් තම නිවෙස් සහ පවුල් අතහැර ගොස් වනයක ජීවත් වෙයි. ඔවුන් ගුරුන් ගේ අනුගාමිකයන් බවට පත්වෙයි. ඔවුන් ගෝපිචන්ද රජුගේ කතාපුවත පවසයි. ඔහු මෙසේ විමසුවා ඔබගේ නිවෙස අත්හරින්නේ ඇයි? ඔබ යන්නේ කොයිබටද? ආගමික ග්‍රන්ථවල බොහෝ කතාපුවත් තිබේ. ඔය බී.කේ.වරුන්ද රජවරුන් වෙතට ගොස් ඔවුන්ට ඥානය සහ යෝගාව කියා දෙයි. රජ කෙනෙකුට ලෝකය පිළිබඳව නිරාශාවක් ඇති වූ අන්දම පෙන්වා ඇති, අෂ්ඨවක්‍ර ගීතාව තිබේ. ඔහු පැවසුවේ මට දෙවියන්ව ලබාගැනීමට උපකාර කළ හැකි කෙනෙකු අවශ්‍යයි. ඔහු මෙය මුළු රාජධානියටම නිවේදනය කළා. මෙය, එම කාලයයි. ඔබ ගොස් මෙම ඥානය රජවරුන්ට ලබා දෙන්නේ, ඔවුන්ට පරම පියාව මුණගැසීමට මඟ පෑදීමටයි. ඔබට පියාව මුණගැසී ඇති අන්දමින්ම ඔබ අන් අයවත් ඔහුට මුණගැස්සවීමට උත්සාහ දරයි. ඔබ ඔවුන්ට පවසන්නේ අපි ඔබව දිව්‍යලෝකයේ පාලකයන් බවට පත් කර, විමුක්තිය සහ ජීවන-මුක්තිය පිරිනමන්නම්. එවිට ඔවුන්ට කියන්න අන් කිසිවෙකු නොව, ශිව බාබා පමණක් සිහිපත් කරන්න! ආරම්භයේදී ඔබ එකිනෙකා දෙස බලමින්, ධ්‍යානගත විය. එය මහා විශ්මයකි! පරමාත්ම පියා මෙම කෙනා තුළ සිටි බැවින්, ඔහු එම ප්‍රාතිහාර්ය පෙන්වීය. සැම කෙනෙකුගේම නූල ඇද්දේ ඔහුයි. බාප් සහ දාදා එක් අයෙක් විය. සැම කෙනෙක්ම පියාගේ සිහිපත් කිරීමෙන් නින්දට ගොස් ඉන්පසුව ධ්‍යානයකට සමවැදෙන, සොහොන් බිමක් අප විසින් නිර්මාණය කරන ලදී. ඒ සැම දෙයක්ම ශිව බාබාගේ දක්ෂකමයි. සමහරුන් එය විජ්ජාවක් යැයි සැලකුවා. මෙය ශිව බාබාගේ ක්‍රීඩාවයි. පරම පියා, මැජික්කරු, ව්‍යාපාරිකයා මෙන්ම මැණික් වෙළෙන්දාය. එමෙන්ම ඔහු රෙදි අපුල්ලන්නා, රන්කරු සහ නීතිඥයාද වෙයි ඔහු සැම කෙනෙක්ව රාවනගේ සිරමැදිරියෙන් නිදහස් කරගනී. සැම කෙනෙක්ම ඔහුට අඬගසයි අහෝ පාරිශුද්ධකරු, දුර ඈත දේශයේ වැසියාණෙනි, පැමිණ අපව පිවිතුරු කරනු මැන! අපවිත්‍ර ලෝකය තුළට, අපවිත්‍ර ශරීරයකින් පැමිණ අපව පිවිතුරු කරන්න! ඔබට දැන් මෙහි අරුත වැටහෙයි. පරම පියා පැමිණ ඔබට පවසන්නේ රාවනගේ දේශයට පැමිණෙන්නට කියා ඔබ මට කන්නලව් කළා. මා උත්තරීතර දේශයේ අසුන්ගෙනයි සිටියේ. දිව්‍යලෝකය ස්ථාපිත කිරීමට, ඔබ මාව අපායට, රාවනගේ දේශයට කැඳෙව්වා. ඔබ පැවසුවේ දැන් අපව සතුටෙහි දේශයට ගෙන යන්න! මා දැන් ඔය දරුවන්ව ගෙන යනවා. එබැවින් මෙය නාටකයයි. මා ඔබට දුන් රාජධානිය අවසන් වී, තඹ යුගයේ පටන්, රාවනගේ රාජධානිය පැවතුණා. ඔබ පාපයන් පහට ඇද වැටුණු අතර, ජගන්නාථපූරි වල එහි ප්‍රතිමා තිබේ. අංක එකට සිටි කෙනා, උපත් 84 ක් ගෙන, දැන් සිටින්නේ අවසාන අංකයේය. නැවතත් අංක එකට යා යුතු කෙනා, ඔහුයි. මෙම බ්‍රහ්ම මෙතැන අසුන් ගෙන සිටිනවා. විෂ්ණුද මෙතැන අසුන්ගෙන සිටිනවා. ඔවුන් අතර ඇති සම්බන්ධතාවය කුමක්ද? ලොවෙහි කිසිවෙක් මෙය නොදනී. සරස්වතී සහ බ්‍රහ්ම ඇත්ත වශයෙන්ම දිව්‍යලෝකයේ අධිපතියන් වන ලක්ෂ්මී සහ නාරායනය. ඔවුන් දැන් අපායේ අධිපතියන්ය. ඔවුන් දැන් ලක්ෂ්මී

සහ නාරායන වීමට, තපස් රකිනවා. මෙහි නිවැරදි සිහිවටනය, දිල්වාලා දේවාලයේ තිබේ. පරම පියා මෙහි පැමිණියා, මේ නිසයි මෙසේ ලියා තිබෙන්නේ සියලුම ආගම් වල වන්දනා ස්ථාන අතුරින්, ශ්‍රේෂ්ඨතම වන්දනා ස්ථානය වන්නේ, අබුය, මන්ද, පරමාත්ම පියා මෙහි පැමිණ, සියලුම ආගම් වල අයට, විමුක්තිය පිරිනමන බැවින්. ඔබ පළමුව සාම දේශයට යන අතර ඉන්පසුව දෙව්ලොව යයි. අන් සෑම කෙනෙක්ම ගොස්, සාම දේශයේ සිටීවි. එම සිහිවටනය අජීවී වන අතර, මෙය ජීවමාන ස්වරූපයයි. ඔබ ඒවායේ ජීවමාන ස්රූපය බවට පත් වූ විට, එම සියලුම දේවාල ආදිය විනාශ වෙයි. පසුව භක්ති මාර්ගයේදී එම සිහිවටන නැවත වරක් නිර්මාණය කෙරෙයි. ඔබ දැන් දිව්‍යලෝකය ස්ථාපනය කරමින් සිටිනවා. මිනිසුන්ගේ විශ්වාසය දිව්‍යලෝකය තිබෙන්නේ උඩ, ඉහළ කියා. මෙම භාරතය දිව්‍යලෝකයව තිබුණු බවත් එය දැන් අපාය බවත් ඔබට වැටහෙයි. ඔබ චක්‍රය දෙස බලන විට, සම්පූර්ණ ඥානයම ඔබගේ බුද්ධියට ඇතුළු වෙයි. අනෙක් ආගම් පැමිණීම ආරම්භ වන්නේ තඹ යුගයෙදීය. බලන්න දැන් කොපමණ ආගම් තිබේද කියා! මෙය කලි යුගයයි. ඔබ දැන් සිටින්නේ සංගම යුගයේය. ඔබ ස්වර්ණමය යුගයට යෑමට උත්සාහ දරමින් සිටිනවා. කලි යුගයේ සෑම කෙනෙකුටම ගලක් වැනි බුද්ධියක් තිබේ. ස්වර්ණමය යුගයේ සෑම කෙනෙකුටම දිව්‍යමය බුද්ධියක් ඇත. ඔබ දිව්‍යමය බුද්ධි තිබුණු අයව සිට, ගල් වැනි බුද්ධි ඇති අය බවට පත් වී සිටියි. ඔබ දැන් නැවතත් දිව්‍යමය බුද්ධි ඇති අය බවට පත් විය යුතුයි. පරම පියා පවසන්නේ ඔබ මට අඬ ගැසුවා, එබැවින් මා දැන් පැමිණ සිටියි. මා ඔබට පවසන්නේ රාගය පරාජය කර, ලෝකය ජයගන්න! ප්‍රධානතම පාපය මෙයයි. ස්වර්ණමය යුගයේ සිටින සෑම කෙනෙක්ම පාපයෙන් තොරයි. කලි යුගයේ ඔවුන් දූෂිතයි. පියා පවසන්නේ දරුවනි, දැන් අවගුණ වලින් තොර වන්න! ඔබ උපත් 63 ක් පාපයේ ගැලෙමින් සිටියා. දැන් මෙම අවසන් උපතෙදී, පාරිශුද්ධ වන්න! දැන් සෑම කෙනෙක්ම මිය යා යුතුයි. මා දිව්‍යලෝකය ස්ථාපිත කිරීමට පැමිණ සිටිමි. එබැවින් දැන් මගේ ශ්‍රීමත් පිළිපදින්න! මා ඔබට කියන දේට ඇහුම් කන් දෙන්න! ඔබගේ බුද්ධි, ගලකින්, දිව්‍යමය බවට පත් කිරීමට ඔබ දැන් උත්සාහ දරමින් සිටිනවා. ඔබ ඉනිමඟ දිගේ පහළටම පැමිණ, ඉන්පසුව ආපසු ඉහළ නගී. ඔබ බහිරවයන් මෙනි. රජ කෙනෙකුගෙන්, බහිරවයෙක්, තමන්ට කිරීමට වැඩක් දෙන්න, යැයි කියූ කතා පුවතක් තිබේ. එබැවින් ඔහුට ඉනිමඟක් දිගේ ඉහළට සහ පහළට යන්නට කියා රජතුමා පැවසුහ. බොහෝ මිනිසුන් පවසන්නේ අපව ඉනිමඟ දිගේ ඉහළට සහ පහළට යැවීමෙන්, දෙවියන් මොනවද මේ කරන්නේ? මෙවන් ඉනිමඟක් නිර්මාණය කිරීමට, දෙවියන්ට වුණේ කුමක්ද? පරමාත්ම පියා විස්තර කරන්නේ මෙය සදාතනික නාටකයක්. ඔබ වසර 5000 කදී උපත් 84 ක් ගෙන ඇත. ඔබට පහළට පැමිණීමට වසර 5000 ක් ගත වූ අතර, ඉන්පසුව ඔබ තත්පරයකදී ඉහළ යයි. මේ ඔබගේ යෝගා බලයේ සෝපානයයි. පරම පියා පවසන්නේ මා සිහිපත් කරන්න, එවිට ඔබගේ පාපයන් කැපී යයි! පියා පැමිණි විට, ඔබ තත්පරයකදී ඉහළ යන අතර, ඉන්පසුව ඔබ වසර 5000 කදී පහළට පැමිණෙයි ඔබගේ අංශක, දිගින් දිගටම අඩුවීගෙන යයි. ඔබට ඉහළ නැඟීමට සෝපානයක් තිබේ.'තත්පරයකදී ජීවන-මුක්තිය'. ඔබ සතෝප්‍රධාන් විය යුතුයි. ඉන්පසුව ඔබ ක්‍රම-ක්‍රමයෙන් තමෝප්‍රධාන් වෙයි එයට වසර 5000 ක් ගත වෙයි. අච්චා, ඉන්පසුව ඔබ තමෝප්‍රධාන් බවින් එක් උපතකදී සතෝප්‍රධාන් විය යුතුයි. මා ඔබට දැන් දිව්‍යලෝකයේ ආධිපත්‍යය ලබා දෙන බැවින්, ඔබ පිවිතුරුව රැඳී නොසිටින්නේද? කෙසේවෙතත්, ඔවුන්ට විෂ නොලැබෙන විට, කෝපය සහ රාගය ඇති අය, ඔවුන්ගේ භාර්යාවන්ට පහර දෙති. ඔවුන්ව නිවසින් පන්නා දමයි, නැතහොත් ඔවුන්ව ගිණි තබයි. දුප්පත් අසරණ මව්වරුන්ට බොහෝ සේ පහර දෙයි. මෙයත් නාටකයේ නියම වී තිබේ. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. අධිපතියෙක් වී ලෝකයේ ආධිපත්‍යය හිමි කරගැනීම සඳහා, රාගය නමැති ප්‍රධානතම සතුරාව පරාජය කරන්න. ඔබ අනිවාර්යෙන්, සම්පූර්ණයෙන්ම පාපයන්ගෙන් තොර විය යුතුයි.
2. ඔබට පියාව හමුවී ඇති ආකාරයෙන්ම, අන් සියලු දෙනාටත් පරම පියාව මුණගැස්සවීමට උත්සාහ දැරිය යුතුයි. පියාගේ සැබෑ හැඳින්වීම ලබා දෙන්න. ඔවුන්ට සත්‍ය වන්දනා ගමන කියා දෙන්න.

**වරදානය:** ඔබ බල අටේ ප්‍රතිමූර්තියක් වී ඔබ ඉදිරියේ ඇති දුක් ලෝකයට මුහුණ දෙමින් දුකෙන් නිදහස් දේශයේ නිදහස අත්විඳිත්වා.

ඔබට දුක පිළිබඳ දැනුම සහ දුකෙන් නිදහස් වීම පිළිබඳ දැනුම ලැබෙන්නේ දැන් පමණයි. ඔබ ඉදිරියේ ඇති දුක් ලෝකයට මුහුණ දෙමින් දුකෙන් නිදහස් දේශයේ නිදහස නිරන්තරව අත්විඳීම, ඔය දරුවන් බල අටේ ප්‍රතිමූර්ති සහ භෞතික ඉන්ද්‍රියන් ජය ගත්තන් වීම පිළිබඳ සලකුණකි. ඔබ පරමාත්ම පියාගෙන් මේ සියලු බල ලබා ගන්නේ දැන් පමණයි. කෙසේවෙතත්, කුමන හෝ ඇසුරක බලපෑම නිසා හෝ ඔබේ භෞතික ඉන්ද්‍රියන්ගේ බලපෑම නිසා ඔබේ බල අහිමි වුවහොත්, ඔබට දුකෙන් නිදහස් දේශයේ කුල්මත් බව සහ සතුට, ඉබේටම නැතිව යනු ඇත. එවිට, දුකෙන් නිදහස් දේශයේ අධිරාජ්‍යයන් වන ඔබ පවා දිළිඳු බවට පත් වනු ඇත.

**පාඨය:** ඔබේ අධිෂ්ඨාන බලය නිරන්තරයෙන් ඔබ සමඟ තබා ගන්න, එවිට සාර්ථකත්වය ඔබේ ගෙල වටා ඇති මල්දම බවට පත්වනු ඇත.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: මෙම අව්‍යක්ත මාසයේ, බන්ධනයෙන් නිදහස් වී ජීවන මුක්ති අවධිය අත්විඳින්න.**

ඔබේ මනසෙහි කුණාටු ඇති විට, හෝ සබඳතා, පදාර්ථ හෝ ගැටළු හරහා කුණාටු හෝ බාධක ඇති විට, ඒවායින් නිදහස් වීමට නම්, යෝග් යුක්ත සහ යුක්ති යුක්ත වන්න. ඔබ යෝග් යුක්ත වන තුරු, ඔබ බන්ධන වලින් බැඳී සිටිනු ඇත.